අවසාන වාර පරීක්ෂණය - 2018 ජූලි
13 ශ්‍රේණිය

රසායන විද්‍යාව I
Chemistry

02 S I

පැය දෙකයි
Two hours

- මෙම ප්‍රශ්න පත්‍රය පිටු 08 කින් යුක්ත වේ.
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
- 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1) (2) (3) (4) (5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන පිළිතුර තෝරාගෙන, එය උත්තර පත්‍රයේ කතිරයක් යොදා දක්වන්න.

alsciencepapers .blogspot.com

සාර්වත්‍ර වායු නියතය $R = 8.314\ J\ K^{-1}\ mol^{-1}$
ඇවගාඩ්‍රෝ නියතය $N_A = 6.022 \times 10^{23}\ mol^{-1}$
ප්ලාන්ක්ගේ නියතය $h = 6.626 \times 10^{-34}\ J\ s$
ආලෝකයේ ප්‍රවේගය $C = 3 \times 10^8\ m\ s^{-1}$

1) H වල විමෝචන වර්ණාවලියේ රේඛා ශ්‍රේණිවල අඩංගු වර්ණාවලි රේඛා අතරින් ඉහළම සංඛ්‍යාතය ඇති රේඛාව ලයිමන් ශ්‍රේණියේ හතරවන රේඛාවේ ශක්තියට සමාන වේ නම් මෙම වර්ණාවලියේ පැවතිය හැකි ශ්‍රේණි ගණන හා මුළු රේඛා ගණන වන්නේ

1) 5 : 12  2) 4 : 16  3) 3 : 8
4) 2 : 6  5) 5 : 10

2) Na, B, Si, S, $Br^-$ ප්‍රභේද වල අරය විචලනය වන අන්දම නිවැරදිව දක්වා ඇත්තේ මින් කුමක්ද ?

1) $Na > B > Si > S > Br^-$  2) $Na > Br^- > Si > S > B$  3) $Br^- > S > Na > Si > B$
4) $Br^- > Na > S > Si > B$  5) $Br^- > S > Na > Si > Br$

3) පහත සංයෝගයේ IUPAC නාමය වන්නේ,



1) 6 - amino - 3 – formyl – 3 – ethylhex – 4 – enoic acid
2) 6 – carbamoyl – 3 – ethyl – 3 – oxo – 4 – hexenoic acid.
3) 6 – carbamoyl – 3 – ethyl – 3 – formyl – 4 – hexenoic acid
4) 3 – ethyl – 3 – formyl – 6 – hydroxy – 2 – hexenamide.
5) 3 – ethyl – 6 – hydroxy – 3 – oxo – 2 – hexenamide

4) නයිට්‍රජන් වල හා එහි සංයෝග වල රසායනය සම්බන්ධයෙන් පහත කවරක් සත්‍ය වේද ?
1) නයිට්‍රජන් වලට ආම්ලික, උභය ගුණී, භාස්මික හා උදාසීන ඔක්සයිඩ සෑදිය හැකිය.
2) $NH_3$ වලට භාස්මික ගුණ , ආම්ලික ගුණ , ඔක්සිකාරක ගුණ හා ඔක්සිහාරක ගුණ ඇත.
3) d ගොනුවේ ලෝහ කැටායන සියල්ලක්ම $NH_3$ සමග පහසුවෙන් සංකීර්ණ අයන සාදයි.
4) නයිට්‍රජන් ඔක්සිකරණය වීම එය ඔක්සිහරණය වීමට වඩා පහසු වේ.
5) ද්‍රව $NH_3$ සමග Li ප්‍රතික්‍රියා කිරීමෙන් $LiNH_2$ සාදයි.

5) X නම් මූල ද්‍රව්‍ය මගින් $X^{2-}$ ඇනායනයක් සාදයි. X හි අවසාන උපශක්ති මට්ටමට අයත් ඉලෙක්ට්‍රෝනයක් සඳහා පිළිගත හැකි ක්වොන්ටම් අංක කුලකය වන්නේ

1) (3, 0, 0,+1/2)  2) (2, 2, -1, +1/2)  3) (2, 0, 1, -1/2)
4) (3, 1, -1, +1/2)  5) (3, 1, -2, +1/2)



Scanned by CamScanner

6) 0.1 $moldm^{-3}$ වන $SnC_2O_4$ ද්‍රාවණයකින් සහ 0.1 $moldm^{-3}$ වන $FeC_2O_4$ ද්‍රාවණයකින් සමාන පරිමාවක් මිශ්‍ර කර ද්‍රාවණයක් සාදන ලදී. එම ද්‍රාවණයෙන් 25.00$cm^3$ක් සමග ආම්ලික මාධ්‍යයේ දී සම්පූර්ණයෙන් ප්‍රතික්‍රියා කිරීම සඳහා වැයවන 0.2 $moldm^{-3}$ $KMnO_4$ද්‍රාවණ පරිමාව ($cm^3$ )කොපමණද ?

1) 5　2) 12.5　3) 15　4) 17.5　5) 35

7) 25°C දී $1 \times 10^{-3}$ $moldm^{-3}$ වන $MgSO_4$ ද්‍රාවණයකින් කිසියම් පරිමාවක් සමග එමෙන් දෙගුණයක පරිමාවක් වන $2 \times 10^{-5}$ $moldm^{-3}$ $Ba(OH)_2$ ද්‍රාවණයක් එකතු කිරීමේ දී පහත කවරක් සිදු වේද ? ( 25°C දී $BaSO_4$ හි $K_{sp} = 1 \times 10^{-10}$ $mol^2dm^{-6}$, $Mg(OH)_2$ හි $K_{sp} = 1 \times 10^{-11}$ $mol^3dm^{-9}$

1) $Mg(OH)_2$ සහ $BaSO_4$ යන දෙකම අවක්ෂේප වේ.
2) $Mg(OH)_2$ පමණක් අවක්ෂේප වේ.
3) $BaSO_4$ පමණක් අවක්ෂේප වේ.
4) කිසිම සංයෝගයක් අවක්ෂේප නොවේ.
5) ස්ථිර පිළිතුරක් ලබාදිය නොහැක.

alsciencepapers .blogspot.com

8) සාපේක්ෂ අණුක ස්කන්ධය 134 ක් වන A නම් සංයෝගයේ C, H, O පමණක් ඇත. මෙම සංයෝගය $H_2SO_4$ ඇති විට Ethanol සමග මුළුමනින්ම ප්‍රතික්‍රියා කළ විට ලැබුණු ඵලයේ සාපේක්ෂ අණුක ස්කන්ධය 190 ක් විය. A සංයෝගයේ $PCl_5$ සමග ප්‍රතික්‍රියා කළ විට ලැබුණු ඵලයේ සාපේක්ෂ අණුක ස්කන්ධය 189.5 ක් විය. A හි ඇති ඇල්කොහොලීය OH කාණ්ඩ සංඛ්‍යාව වනුයේ

1) 1　2) 2　3) 3　4) 4　5) 5

9) S ගොනුවේ මූලද්‍රව්‍යයකින් 9.66 g ක් වාතයේ දහනය කළ විට ලද ලා කහ පැහැති ඝන ශේෂයේ ස්කන්ධය 16.22 g ක් විය. එම ශේෂය ජලයේ දිය කළවිට අවර්ණ ද්‍රාවණයක් ලැබුණු අතර පිට වූ $O_2$ ස්කන්ධය 3.2g ක් විය. ( Li = 7, Na = 23, K = 39, Ba = 137, Mg = 24 ) මූල ද්‍රව්‍ය විය හැක්කේ

1) Na　2) Li　3) Mg　4) Ba　5) K

10) එකම තලයේ පරමාණු 3 ක් පමණක් ඇත්තේ පහත කුමන අණුවේද ?

1) $XeF_4$　2) $CCl_4$　3) $SF_4$　4) $BCl_3$　5) $PCl_5$

11) පරිමාව 4.157 $dm^3$ වන දෘඩ භාජනයක අඩංගු $CaCO_3$ 10g ක් ගෙන 927 °C හි උෂ්ණත්වයකදී පද්ධතිය සමතුලිතතාවය පත් වීමට ඉඩ හරින ලදී.

$(CaCO_3(s) \rightleftharpoons CaO(s) + CO_2(g)$

ඉහත සමතුලිතය සඳහා $K_p = 1.2 \times 10^5\ Nm^{-2}$ වේ. $CaCO_3$ වල විඝෝජන ප්‍රතිශතය සොයන්න.

1) 10%　2) 20%　3) 50%　4) 60%　5) 75%

12) Triamminebromidohydridonitritocobaltate (II) අයනයේ ව්‍යුහ සූත්‍රය නිවැරදිව දක්වා ඇත්තේ මින් කුමකද?

1) $[CoHNO_2Br(NH_3)_3]^-$　2) $[CoBr(NH_3)_3NO_2H]^-$
3) $[CoBrH(NH_3)_3NO_2]^-$　4) $[Co(NH_3)_3BrHNO_2]^-$
5) $[CoBrHNO_2(NH_3)_3]^-$

13) වායු කලාපයේ පවතින A වායුව සමග B ප්‍රතික්‍රියා කිරීමෙන් පහත සමතුලිතය ඇති වේ.

$A(g) + 2B(g) \rightleftharpoons C(g)$

B නම් ද්‍රවය එහි වාෂ්පය සමග සමතුලිතව පවතී. අදාල උෂ්ණත්වයේ දී B හි සංතෘප්ත වාෂ්ප පීඩනය $2 \times 10^{-5}$ Pa වේ.

A වලින් 20% ක් ප්‍රතික්‍රියා වී පවතී නම් අදාල උෂ්ණත්වයේදී ඉහත සමතුලිතය සඳහා $K_p$ ගණනය කරන්න.
( A(g) හා C(g) වායු B ද්‍රවයේ දිය නොවන බවත් සියළුම වායු පරිපූර්ණ හැසිරීම දක්වන බවත් සලකන්න.)

1) $2.5 \times 10^{10}\ Pa^{-2}$　2) $2 \times 10^{10}\ Pa^{-2}$　3) $1.5 \times 10^{10}\ Pa^{-2}$
4) $1.25 \times 10^{8}\ Pa^{-2}$　5) $6.25 \times 10^{8}\ Pa^{-2}$



Scanned by CamScanner

14) P හා Q නම් වාෂ්පශීලී ද්‍රව දෙකකින් යුත් ද්විසංඝ පරිපූර්ණ ද්‍රාවණයක් සමග සමතුලිතව පවතින වාෂ්ප කලාපයේ Q වල මවුල ප්‍රතිශතය 50% ක් වන අතර Q වල සංතෘප්ත වාෂ්ප පීඩනය P වල සංතෘප්ත වාෂ්ප පීඩනය මෙන් දෙගුණයක් වේ. ද්‍රව කලාපයේ P වල මවුල ප්‍රතිශතය සොයන්න.

1) 25% 2) 33 % 3) 50% 4) 67% 5) 75%

15) 0.1 $moldm^{-3}$ වන ඒක ආම්ලික දුබල භෂ්මයක් අඩංගු ජලීය ද්‍රාවණයක් පරිමාව 100 ගුණයක් වන තුරු ජලය එකතු කිරීමේ දී එහි විඝටන ප්‍රමාණ ආරම්භක විඝටන ප්‍රමාණය මෙන් කොපමණ ගුණයකින් වෙනස් වේද ? (සලකා බලන උෂ්ණත්වයේ දී භෂ්මයේ විඝටන නියතය $1 \times 10^{-5}$ $moldm^{-3}$ )

1) 100 ගුණයකින් වැඩි වේ.
2) 100 ගුණයකින් අඩු වේ.
3) 10 ගුණයකින් වැඩි වේ.
4) 10 ගුණයකින් අඩු වේ.
5) විඝටන ප්‍රමාණයේ වෙනසක් සිදු නොවේ.

16) පහත දක්වෙන කාබනික ප්‍රතික්‍රියා යාන්ත්‍රණ ඇසුරින් සිදුවීමට වඩාත්ම ඉඩ ඇත්තේ කුමක්ද ?




alsciencepapers .blogspot.com

17) A + B → C යනු මූලික ප්‍රතික්‍රියාවකි. A හා B 1 mol බැගින් පරිමාව S වන නියත පරිමා බඳුනක් තුල ප්‍රතික්‍රියා වීමට සලස්වන ලදී. t නම් කාලයකදී භාජනයේ C මවුල ප්‍රමාණය a mol වන බව සොයා ගන්නා ලදී. t කාලයේ දී ප්‍රතික්‍රියාවේ සීඝ්‍රතාවය R නම් හා සීඝ්‍රතා නියතය k වේ නම් a හි අගය වන්නේ,

1) $\frac{k-RS}{k}$ 2) $1-\frac{RS^2}{k}$ 3) $\frac{\sqrt{k}-\sqrt{RS}}{\sqrt{k}}$

4) $\frac{\sqrt{k}-\sqrt{R}}{\sqrt{k}}S$ 5) $1-\frac{RS}{k}$

18) 25°C දී පහත සඳහන් විද්‍යුත් රසායනික කෝෂයේ විභවය හා කෝෂ ප්‍රතික්‍රියාව පිළිවෙලින් වනුයේ

$M(s) / M^{2+}(aq) // M^{3+}(aq) / M^{2+}(aq), Pt(s)$

$E^0$ $M^{2+}(aq) / M(s) = -0.44$ V $E^0$ $M^{3+}(aq) / M^{2+}(aq) = +0.77$V

1) - 1.21 V; $M(s) + M^{3+}(aq) \longrightarrow 2M^{2+}(aq)$
2) 1.21 V; $M(s) + 2M^{3+}(aq) \longrightarrow 3M^{2+}(aq)$
3) 1.21 V; $M(s) + 2M^{3+}(aq) \longrightarrow 3M^{2+}(aq)$
4) - 1.21 V; $M(s) + 2M^{3+}(aq) \longrightarrow 3M^{2+}(aq)$
5) 1.21 V; $M(s) + 3M^{2+}(aq) \longrightarrow 2M^{3+}(aq)$



Scanned by CamScanner

19) $Cu^{2+}$, $Ni^{2+}$ සහ $Fe^{3+}$ අයන අඩංගු ජලීය ද්‍රාවණ සම්බන්ධයෙන් සත්‍ය වන්නේ,

1) ආම්ලික මාධ්‍යයේ දී KI එකතු කිරීමෙන් ද්‍රාවණයේ පැහැදිලි වෙනසක් ඇති කරනුයේ $Fe^{3+}$ මගින් පමණි.
2) භාස්මික මාධ්‍යයේදී $H_2S$ බුබුළනය කිරීමෙන් $Ni^{2+}$ පමණක් අවක්ෂේප වේ.
3) ජලීය $NH_3$ ද්‍රාවණයක් වැඩිපුර එකතු කිරීමෙන් අයන තුන මගින්ම අවක්ෂේප ලබා දේ.
4) සාන්ද්‍ර HCl වැඩිපුර එකතු කිරීමෙන් අයන ද්‍රාවණ එකිනෙක වෙන්කර හඳුනාගත හැකිය.
5) තනුක HCl මගින් ආම්ලික කර $H_2S$ එකතු කිරීමෙන් එක් අයනයක් මගින් පමණක් සල්ෆයිඩ අවක්ෂේපයක් ලබා දේ.

20) පහත දක්වෙන ප්‍රතික්‍රියා සඳහා 25°C දී සමතුලිතතා නියත සලකන්න.

$HF(aq) \rightleftharpoons H^+(aq) + F^-(aq) \quad K_1 = 3.53 \times 10^{-4}\ mol\ dm^{-3}$

$Ca^{2+}(aq) + 2HF(aq) \rightleftharpoons CaF_2(s) + 2H^+(aq) \quad K_2 = 4.15 \times 10^{3}\ mol^{-1}\ dm^{3}$

ඉහත දත්ත උපයෝගී කර ගනිමින් 25°C දී $CaF_2(s)$ හි $K_{SP}$ (ද්‍රාව්‍යතා ගුණිතය ) වන්නේ,

1) $1.5 \times 10^{-11}\ mol^3dm^{-9}$
2) $4.7 \times 10^{-11}\ mol^3dm^{-9}$
3) $3 \times 10^{-11}\ mol^3dm^{-9}$
4) $6 \times 10^{-11}\ mol^3dm^{-9}$
5) $1 \times 10^{-7}\ mol^3dm^{-9}$

21) 3d මූල ද්‍රව්‍ය පිළිබඳව අසත්‍ය ප්‍රකාශය වනුයේ,

1) 3d මූල ද්‍රව්‍ය අතරින් පළමු අයනීකරණ ශක්තිය උපරිම වන්නේ Zn වලටය.
2) 3d මූල ද්‍රව්‍ය වල ඝනත්වය Sc සිට Zn දක්වා වැඩි වේ.
3) 3d මූල ද්‍රව්‍ය අතරින් Zn, Cu, සහ Mn වල ද්‍රවාංක පෙළ Zn < Cu < Mn ලෙස ආරෝහණය වේ.
4) 3d මූල ද්‍රව්‍ය වල ඉලෙක්ට්‍රෝන පිට කිරීමේ හැකියාව S ගොනුවේ මූලද්‍රව්‍යවලට සාපේක්ෂව අඩුයි.
5) S ගොනුවට සාපේක්ෂව මෙම මූල ද්‍රව්‍ය වල පරමාණුක අරය කුඩාය.

22) $a(A)(g) + bB(g) \rightleftharpoons cC(g)$

යන 27°C දී සිදුවන සමතුලිත ප්‍රතික්‍රියාවට අදාල ශක්ති වක්‍රය පහත දක් වේ.




$E_f = 50\ kJ\ mol^{-1}$
$E_b = 200\ kJ\ mol^{-1}$

alsciencepapers .blogspot.com

ඉහත ප්‍රතික්‍රියාවේ පිළිවෙලින් ΔH හා ΔS දක්වා ඇත්තේ මින් කුමක්ද ?

1) $150\ kJ\ mol^{-1}$ , $500\ JK^{-1}\ mol^{-1}$
2) $-150\ kJ\ mol^{-1}$ , $500\ JK^{-1}mol^{-1}$
3) $150\ kJ\ mol^{-1}$ , $-500\ JK^{-1}\ mol^{-1}$
4) $-150\ kJ\ mol^{-1}$ , $-500\ JK^{-1}\ mol^{-1}$
5) ඉහත ගණනය කිරීම සඳහා දත්ත ප්‍රමාණවත් නොවේ.

23) $CH_3CH_2Cl$ සම්බන්ධයෙන් පහත කවරක් අසත්‍ය වේද ?

1) එය $CH_3CH_2MgCl$ සමග ප්‍රතික්‍රියා කිරීමෙන් $CH_3CH_2CH_2CH_3$ සාදේ.
2) එය NaOH සමග තනි පියවරකින් ප්‍රතික්‍රියා කිරීමෙන් $CH_3CH_2OH$ සාදේ.
3) එය $CH_3-\overset{O}{\overset{\|}{C}}-NH_2$ සමග ප්‍රතික්‍රියා කිරීමෙන් $CH_3-\overset{O}{\overset{\|}{C}}-\overset{H}{N}-CH_2CH_3$ සාදේ.
4) එය  සමග ප්‍රතික්‍රියා කිරීමෙන්  සාදේ.
5) එයට $CH_3CH_2I$ වලට වඩා අඩු තාපාංකයක් පවතී.



Scanned by CamScanner

24) $C_4H_{10}O \xrightarrow{PCC} P \xrightarrow{NaCN / H^+} Q \xrightarrow[\Delta]{සා. H_2SO_4} R$

ත්‍රිමාණ සමාවයවික සංයෝගයකි.

ඉහත දක්වෙන ප්‍රතික්‍රියා අනුක්‍රමයෙහි P, Q හා R හි ව්‍යුහ පිළිවෙලින් වනුයේ

| | P | Q | R |
|---|---|---|---|
| 1) | $CH_3CH(OH)CH_2CH_3$ | $CH_3CH(CN)CH_2CH_3$ | $CH_3-CH(COOH)CH_2CH_3$ |
| 2) | $CH_3-C(=O)-CH_2CH_3$ | $CH_3-C(COOH)(OH)-CH_2CH_3$ | $CH_3-C(COOH)=CHCH_3$ |
| 3) | $CH_3CH_2CH_2-C(=O)-H$ | $CH_3CH_2CH_2-CH(OH)(CN)$ | $CH_3CH_2CH=CHCN$ |
| 4) | $CH_3CH_2-C(=O)-CH_3$ | $CH_3CH_2-C(CN)(OH)-CH_3$ | $CH_3CH=C(COOH)-CH_3$ |
| 5) | $CH_3-C(=O)-CH_2CH_3$ | $CH_3-C(OH)(CN)-CH_2CH_3$ | $CH_3-C(CN)=CHCH_3$ |

25) පහත කුමන ඒවා මිශ්‍ර කල විට සල්ෆර් අවක්ෂේප නොවේ ද ?

1) ආම්ලික $AsO_4^{3-}$ සහ $H_2S$

2) ආම්ලික $Fe^{3+}$ සහ $S_2O_3^{2-}$

alsciencepapers .blogspot.com

3) $H_2O_2$ සහ PbS

4) $Br_2$ සහ $H_2S$

5) $SO_2$ සහ $H_2S$

26) තාපාංක වැඩිවීම නිවැරදිව දක්වා ඇත්තේ,

1) $CH_3F < CCl_4 < H_2O_2 < H_2O$

2) $CH_3F < H_2O_2 < H_2O < CCl_4$

3) $CH_3F < CCl_4 < H_2O < H_2O_2$

4) $CCl_4 < CH_3F < H_2O < H_2O_2$

5) $CCl < H_2O < CH_3F < H_2O_2$

27) A නමැති කාබනික සංයෝගය

1) $NaNO_2$ සමග $N_2$ පිටකරයි.

2) $NH_3 / AgNO_3$ සමග රිදී කැඩපතක් ලබාදේ.

3) ජලීය $Na_2CO_3$ සමග $CO_2$ පිට කරයි.

A විය හැක්කේ,

1) 

2) 

3) 

4) 

5) 



Scanned by CamScanner

28) 25°C හිදී 0.2 moldm$^{-3}$ $NH_4OH$ ද්‍රාවණ 100.00 cm$^3$ ක් සමඟ $NH_4Cl$ 5.35g ක් ජලයේ දියකර සාදාගත් ජලීය ද්‍රාවණයේ 100.00 cm$^3$ ක් මිශ්‍ර කරන ලදී. ද්‍රාවණයේ pH අගය වනුයේ
(25°C හිදී $NH_3$ හි $K_b = 1.0 \times 10^{-5}$ mol dm$^{-3}$ ජලයේ $Kw = 1 \times 10^{-14}$ mol$^2$ dm$^{-6}$)

1) 6 2) 7 3) 8 4) 9 5) 10

29) පීඩනය $2 \times 10^5$ Pa හිදී 927°C ක උෂ්ණත්වයක් යටතේ පවතින $NH_3$ වායුව 4.157 dm$^3$ ක් උපයෝගී කරගනිමින් ඔස්වල්ඩ් ක්‍රමය මගින් $HNO_3$ නිෂ්පාදනයේදී අවශ්‍ය අවම $O_2$ මවුල ගණන සහ උපරිම $HNO_3$ මවුල ගණන සම්බන්ධයෙන් සත්‍ය වනුයේ,

1) $O_2$ 200 mol සහ $HNO_3$ 100 mol
2) $O_2$ 100 mol සහ $HNO_3$ 200 mol
3) $O_2$ 800 mol සහ $HNO_3$ 400 mol
4) $O_2$ 400 mol සහ $HNO_3$ 800 mol
5) $O_2$ 125 mol සහ $HNO_3$ 250 mol

30) පහත සඳහන් එක් එක් ද්‍රව / ද්‍රාවණවල සංසංජන ආකර්ෂණය වන නිවැරදි අනුපිළිවෙල කුමක්ද?

A - සංශුද්ධ ජලය
B - 1.0 mol dm$^{-3}$ ජලීය $CH_3OH$ ද්‍රාවණය
C - 2 mol dm$^{-3}$ ජලීය ග්ලූකෝස් (M = 180 g mol$^{-1}$) ද්‍රාවණ
D - 1.5 mol dm$^{-3}$ ජලීය සුක්‍රෝස් (M = 342 g mol$^{-1}$) ද්‍රාවණ

1) D < C < B < A
2) C < D < B < A
3) C < D < A < B
4) B < A < C < D
5) B < A < D < C

*** 31 සිට 40 දක්වා ප්‍රශ්න සඳහා උපදෙස්**

31 සිට 40 දක්වා ප්‍රශ්න වලදී දී ඇති ප්‍රතිචාර වලින් එකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි වේ. කවර ප්‍රතිචාරය / ප්‍රතිචාර නිවැරදි ද යන්න පළමුව විනිශ්චය කරන්න.
පසුව පිළිතුර සඳහා නිවැරදි අංකය තෝරන්න.

alsciencepapers .blogspot.com

| උපදෙස් සැකෙවින් | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| a, හා b නිවැරදිය | b හා c නිවැරදිය | c හා d නිවැරදිය | a හා d නිවැරදිය | වෙනත් කිසියම් ප්‍රතිචාරයක් / ප්‍රතිචාර නිවැරදිය |

31) X නම් හයිඩ්‍රොකාබන ව්‍යුහය පහත දක්වා ඇත. (මෙහි D යනු හයිඩ්‍රජන් වල සමස්ථානිකයක් වන ඩියුටීරියම් වේ)



ඉහත X සම්බන්ධයෙන් පහත සඳහන් කවරක් සත්‍ය වේද?

a) කාබන් පරමාණු අතර බන්ධන දිග $k < n < m < l$ ලෙස විචලනය වේ.
b) එහි ඒකරේඛීයව පිහිටන උපරිම කාබන් පරමාණු ගණන හතරකි.
c) X හි එක් අසමමිතික කේන්ද්‍රයක් පමණක් ඇත.
d) $sp^2$ මුහුම්කරණය වූ C පරමාණු 8ක් ඇත.

32) පහත සඳහන් වගන්ති අතරින් කාර්මික ක්‍රියාවලි සම්බන්ධයෙන් කවර වගන්ති / වගන්තිය සත්‍ය වේද?

a) ඩවුන්ස් කෝෂය මගින් Na නිපදවීමේදී ඉහළ විභව අන්තරයක් සහ අඩු විද්‍යුත් ධාරාවක් උපයෝගී කරගනී.
b) සොල්වේ ක්‍රමයට සමාන ක්‍රමයක් මගින් $KHCO_3$ නිපදවිය හැකි නොවේ.
c) යකඩ නිස්සාරණයේදී FeO ඔක්සිහරණ වීම C මගින් සිදු වීමට වඩා CO මගින් සිදු වීම පහසුවේ.
d) යූරියා නිෂ්පාදනයේදී සිදුවන පළමු පියවර තාප අවශෝෂක වන අතර දෙවන පියවර තාප දායක වේ.



Scanned by CamScanner

33) රසායනික කෝෂ සම්බන්ධයෙන් පහත කවර ප්‍රකාශය / ප්‍රකාශ සත්‍ය වේද?

a) කෝෂ ප්‍රතික්‍රියාවක් ස්වයංසිද්ධ විය යුතුය.

b) කෝෂ ප්‍රතික්‍රියාවක් තාපදායක විය යුතුය.

c) ඇනෝඩයේ අයන සාන්ද්‍රණය වැඩිවන විට $E_{cell}$ අඩුවේ.

d) ඉලෙක්ට්‍රෝඩ ප්‍රතික්‍රියා ප්‍රතිවර්තනය කළ හැක.

34) එක්තරා රසායනික ප්‍රතික්‍රියාවක චාලකය හැදෑරීමෙන් ලබාගත් තොරතුරු කිහිපයක් පහත දක්වේ.

- එක් ප්‍රතික්‍රියකට සාපේක්ෂව පෙළ ශූන්‍ය වේ.
- pH අගය 12 සිට 13 දක්වා වැඩි කිරීමේදී ප්‍රතික්‍රියාවේ සීඝ්‍රතාවය දස ගුණයකින් වැඩිවේ.
- අර්ධ ආයු කාලයේ ප්‍රතික්‍රියක සාන්ද්‍රණයෙන් ස්වායත්ත වේ.

ඉහත තොරතුරුවලට අනුව අදාළ ප්‍රතික්‍රියාව සම්බන්ධයෙන් ලබාගත හැකි නිගමනය / නිගමන පහත කවරේද?

a) මූලික ප්‍රතික්‍රියාවක් විය නොහැක.

b) සමස්ථ පෙළ එක වේ.

c) අණුකතාවය එක වේ.

d) $H^+$ ට සාපේක්ෂව පෙළ එක වේ.

35) $Fe(OH)_2$ ඝනය ජලයේ දියකිරීමෙන් සාදාගන්නා ලද සමතුලිත මිශ්‍රණයට පහත එක් එක් විපර්යාසයන් වෙන වෙනම සිදුකරනු ලැබේ. $Fe(OH)_2$ හි ජල ද්‍රාව්‍යතාවය වැඩිවීමට තුඩු දෙන විපර්යාසය / විපර්යාස මොනවාද?

a) $Fe(NO_3)_3$ ද්‍රාවණයෙන් ස්වල්පයක් එකතු කිරීම.

b) $NH_3$ ද්‍රාවණයෙන් ස්වල්පයක් එකතු කිරීම.

c) HCl ද්‍රාවණයෙන් ස්වල්පයක් එකතු කිරීම.

d) උෂ්ණත්වය වැඩිකිරීම.

36) පරිසර දූෂණය සම්බන්ධයෙන් පහත කවර වගන්තිය / වගන්ති සත්‍ය වේද?

a) අම්ල වැසි සඳහා වායුගෝලීය $CO_2$ දායක වේ.

b) වායුගෝලයේ CFC මට්ටම පහළ බැවින් ගෝලීය උෂ්ණත්වකරණයට එහි දායකත්වය අඩුය.

c) CFC වායුව ඕසෝන් ස්ථරය ක්ෂය වීමට දායක වන Cl මුක්ත ඛණ්ඩක සෑදීම ස්ථර ගෝලයේදී සිදුවේ.

d) ඔක්සිකරණය උත්ප්‍රේරණය කර CO වායුගෝලයෙන් ඉවත් කරන එන්සයිම ඇතැම් පාංශු ක්ෂුද්‍ර ජීවීන් සතුය.

37) බහු අවයවික සම්බන්ධයෙන් පහත කුමන ඒවා සත්‍ය වේද?

a) නයිලෝන් සෑදීමේදී $HOOC(CH_2)_4COOH$, අම්ලය වෙනුවට එහි අම්ල ක්ලෝරයිඩය භාවිතා කළ විට බහු අවයවීකරණ ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම වේ.

b) ටෙෆ්ලෝන් ඉහළ උෂ්ණත්වයට ඔරොත්තු දෙන අතර තාප ස්ථාපන බහු අවයවයක් වේ.

c) $H_2N-\underset{\displaystyle R}{\overset{\displaystyle H}{\underset{|}{\overset{|}{C}}}}-COOH$ සහ ඒක අවයවික සංඝනන බහු අවයවීකරණයෙන් පොලිපෙප්ටයිඩ සෑදේ.

d) $\left[ -\underset{\displaystyle H}{\underset{|}{N}}-(CH_2)_6-\underset{\displaystyle H}{\underset{|}{N}}-\overset{\displaystyle O}{\overset{\|}{C}}-(CH_2)_4-\overset{\displaystyle O}{\overset{\|}{C}}-N- \right]$ නයිලෝන -6, 6, සඳහා පුනරාවර්තන ඒකකය වේ.



Scanned by CamScanner

38) පහත සඳහන් වගන්ති අතරින් කුමක් / කුමන ඒවා අසත්‍ය වේද?

a) $CH_3CH_2-\overset{O}{\overset{\|}{C}}-CH_3$ (butanone) සහ $CHBr_3$ (බ්‍රොමොෆෝම්) මිශ්‍ර කිරීමේදී පරිමා සංකෝචනයක් සිදුවේ.

b) $CH_3COOH$ සහ $H_2O$ මිශ්‍ර කිරීමේදී උෂ්ණත්වය පහළ යයි.

c) DCl වල ස්කන්ධය HCl වල ස්කන්ධයට වඩා වැඩි බැවින් DCl හා HCl අඩංගු මිශ්‍රණයක් අපරිපූර්ණ ද්‍රාවණයක් සාදයි.

d) $CH_3CH_2CH_2OH$ සහ 

(Toluene) මිශ්‍රණයක් ධන අපරිපූර්ණ ද්‍රාවණයක් සාදයි.

39) a) ලවණයේ ජලීය ද්‍රාවණයකට $Na_2CO_3$ ස්වල්පයක් එකතු කිරීමේදී $CO_2$ මුක්ත වේ.

b) ලවණයේ ජලීය ද්‍රාවණයට $NH_4Cl$ / $NH_4OH$ එකතු කිරීමේදී අවක්ෂේප සාදන

c) ලෝහ හයිඩ්‍රොක්සයිඩය වැඩිපුර NaOH වල ද්‍රාව්‍ය වන

ඉහත නිරීක්ෂණ තුනම දක්වන්නේ පහත කවරක්ද?

a) $FeCl_3$ b) $CrCl_3$ c) $ZnCl_2$ d) $AlCl_3$

40) $A(s) + 3B(g) \rightleftharpoons C(g) + 2D(g)$ $\Delta H > 0$

ඉහත සමතුලිතය සම්බන්ධව පහත කවර වගන්තිය / වගන්ති සත්‍ය වේද?

a) පද්ධතියට A(s) ඝනය එකතු කිරීමේදී ප්‍රතික්‍රියාව දකුණට නැඹුරු වේ.

b) පද්ධතියේ පරිමාව අඩු කිරීමේදී ප්‍රතික්‍රියාව වමට නැඹුරු වේ.

c) උෂ්ණත්වය වැඩි කරන විට ප්‍රතික්‍රියාව දකුණට නැඹුරු වේ.

d) නියත උෂ්ණත්වයකදී ඉහත සමතුලිතය සඳහා $Kc = \frac{K_p}{RT}$ වේ.

අංක 41 සිට 50 තෙක් ප්‍රශ්නවලට උපදෙස්

| ප්‍රතිචාරය | පළමුවැනි වගන්තිය | දෙවැනි වගන්තිය |
|---|---|---|
| (1) | සත්‍යය | සත්‍ය වන අතර පළමුවැන්න නිවැරදිව පහදා දෙයි |
| (2) | සත්‍යය | සත්‍ය වන නමුත් පළමුවැන්න නිවැරදිව පහදා නොදෙයි |
| (3) | සත්‍යය | අසත්‍යයයි |
| (4) | අසත්‍යයයි | සත්‍යය |
| (5) | අසත්‍යයයි | අසත්‍යයයි |

| | පළමුවැනි වගන්තිය | දෙවැනි වගන්තිය |
|---|---|---|
| 41) | ඉහළ නොවූ උෂ්ණත්වයක් යටතේ වාතය භාගික ආසවනය කිරීමේදී $N_2$ වලට ප්‍රථමයෙන් $O_2$ ද්‍රව බවට පත්වේ. | $O_2$ වායුවේ අවධි උෂ්ණත්වය $N_2$ හි අවධි උෂ්ණත්වයට වඩා ඉහළ වේ. |
| 42) | $CH_3-\underset{CH_3}{\overset{CH_3}{C}}-Cl$ වලට වඩා පහසුවෙන්  ජල විච්ඡේදනයට ලක්වේ. | $CH_3-\underset{CH_3}{\overset{CH_3}{C}}{}^+$ අයනයට වඩා  වල ස්ථායීතාවය ඉහළ වේ. |
| 43) | එතනෝල් ($C_2H_5OH$) වලට වඩා ඔක්ටේන් ($C_8H_{18}$) වල වාෂ්පශීලීතාවය වැඩිවේ. | $C_2H_5OH$ වල හයිඩ්‍රජන් බන්ධන පවතී. |

| | | |
|---|---|---|
| 44) | උෂ්ණත්වය වැඩි කරන සෑම විටම ප්‍රතික්‍රියාවක ශීඝ්‍රතාවය ඉහළ යයි. | උෂ්ණත්වය වැඩි කරන සෑම විටම ප්‍රතික්‍රියාවක ΔH (සම්මත ශක්තිය) වල සෘණ අගය වැඩිවේ. |
| 45) | $Li_2CO_3 < Na_2CO_3 < K_2CO_3$ ලෙස පළමුවන කාණ්ඩයේ කාබනේට වල ජල ද්‍රාව්‍යතාවය වැඩිවේ. | පළමුවන කාණ්ඩයේ පහළට යාමේදී කාබනේට වල අයනික ලක්ෂණ වැඩිවේ. |
| 46) | දුම්වැටි දහනයේදී පරිසරයට NOx වායු එකතු වේ. | දුම්වැටි දහනයේදී උෂ්ණත්වය $900^0C$ ඉක්මවයි. |
| 47) | $[Ag(NH_3)_2]Cl$ අඩංගු ජලීය ද්‍රාවණයක් තුළින් $H_2S$ යැවීමේදී කළු පැහැති අවක්ෂේපයක් සෑදේ | $NH_3$ තුළ AgCl ද්‍රාව්‍ය වුවද $Ag_2S$ ද්‍රාව්‍ය නොවේ |
| 48) | තාත්වික වායුවක Z>1 වන සෑම අවස්ථාවේදීම උෂ්ණත්වය වැඩිකිරීමේදී Z හි අගය අඩු වේ. | තාත්වික වායුවක උෂ්ණත්වය වැඩි කරන සෑම විටම පරිපූර්ණ හැසිරීමට ආසන්න වේ. |
| 49) | BiOCl ජලයේදීට වඩා සාන්ද්‍ර HCl තුළ ද්‍රාව්‍ය වේ. | $HOCl(aq) \rightleftharpoons H^+(aq) + OCl^-(aq)$ යන සමතුලිතය ආම්ලික මාධ්‍යයේදී වම් දෙසට නැඹුරු වේ. |
| 50) | Cd මගින් සාදන සියලුම සංයෝග අවර්ණ වේ. | $Cd^{2+}$ අයනයේ අවසාන d උප ශක්ති මට්ටමේ $d^{10}$ ඉලෙක්ට්‍රෝන වින්‍යාසයක් පවතී. |

alsciencepapers .blogspot.com



Scanned by CamScanner

සියලු හිමිකම් ඇවිරිණි / All Rights Reserved



## B කොටස - රචනා

ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න. (එක් ප්‍රශ්නයකට ලකුණු 15 බැගින් ලැබේ.)

5) a) i) පරිමාව V වන දෘඪ බඳුනක් තුළ $P_1$ පීඩනයේ හා කෙල්වින් $T_1$ උෂ්ණත්වයේ දී $PCl_5(g)$ හි මවුල 0.5ක් අඩංගු වේ. බඳුනේ උෂ්ණත්වය කෙල්වින් $T_2$ දක්වා වැඩිකළ විට පහත ප්‍රතික්‍රියාව අනුව $PCl_5(g)$ විඝටනයවී සමතුලිතතාවයට එළඹේ.

$$PCl_5(g) \rightleftharpoons PCl_3(g) + Cl_2(g)$$

සමතුලිත පීඩනය $P_2$ නම්, $PCl_5(g)$ හි විඝටන ප්‍රමාණය α

$$\alpha = \frac{T_1P_2 - T_2P_1}{T_2P_1}$$ යන ප්‍රකාශනයෙන් ලබා දෙන බව ව්‍යුත්පන්න කරන්න. (ලකුණු 20)

ii) ඉහත (i) කොටසේ $PCl_5(g)$ හි සමතුලිතතාවයට එළඹෙන අවස්ථාව සලකන්න. දෘඪ බඳුනක් තුළට $PCl_5(g)$, $PCl_3(g)$ හා $Cl_2(g)$ වායු අතුරින් එකක්, දෙකක් හෝ තුනම ඇතුළත් කර සමතුලිතතාවයට එළඹෙන අවස්ථාව දක්වා කාලයත් සමඟ සාන්ද්‍රණය විචලනය වන ආකාරය පහත a,b,c, හා d යන ප්‍රස්ථාර හතරෙන් නිරූපණය කරනු ලැබේ. මෙම පද්ධතිය සඳහා $K_c < 0.3\ moldm^{-3}$ වේ. ඒ අනුව ඉහත සමතුලිතය නිවැරදිව විස්තර කරන ප්‍රස්ථාරය තෝරන්න. මෙහිදී ඉහත සමතුලිතය හා එකඟ නොවන ප්‍රස්ථාර පිට හේතු ඉදිරිපත් කරමින් පැහැදිලි කළ යුතුයි. (ලකුණු 20)




alsciencepapers .blogspot.com



Scanned by CamScanner

b) පහත සඳහන් ප්‍රතික්‍රියාව සලකන්න.

$X(g) \rightleftharpoons Y(g) + Z(g)$

X වායුව පරිමාව විචලනය කළ හැකි බඳුනකට දමා $127^{0}C$ උෂ්ණත්වයට රත් කළ විට සමතුලිතතාවට එළඹුණි. සමතුලිත සාන්ද්‍රණය $[X_{(g)}] = 0.2\ mol\ dm^{-3}$ , $[Y_{(g)}] = [Z_{(g)}] = 0.4\ mol\ dm^{-3}$

i) $127^{0}C$ ඉහත සමතුලිතය සඳහා Kc ගණනය කරන්න.

ii) පද්ධතියේ උෂ්ණත්වය $127^{0}C$ ම පවත්වා ගනිමින් බඳුන තුළ පීඩනය එකවරම ආරම්භක පීඩනයෙන් භාගයක් බවට පත් කරන ලදී. මෙවිට ඉහත ප්‍රතික්‍රියාව සඳහා $Q_c = \frac{[Y(g)][Z(g)]}{[X(g)]}$ යන ප්‍රකාශනයට අදාළ $(Q_c)$ අගය ගණනය කරන්න.

iii) ඉහත ii) හි ගණනය කළ $Q_c$ ඇසුරින් ,පද්ධතියේ ඉදිරි ප්‍රතික්‍රියාවද, පසු ප්‍රතික්‍රියාවද යන්න පුරෝකථනය කරන්න.

iv) මෙවිට සමතුලිත සාන්ද්‍රණය ගණනය කරන්න.

v) ඉහත i) හි සඳහන් පද්ධතිය එම උෂ්ණත්වයේම තබා ගනිමින් පීඩනය ආරම්භක පීඩනයෙන් දෙගුණයක් කළහොත් එම අවස්ථාව සඳහා $Q_c$ ගණනය කරන්න. ප්‍රතික්‍රියාවේ දිශානතිය ගැන අදහස් ප්‍රකාශ කරන්න.

vi) ඉහත v) හි සඳහන් අවස්ථාවේදී සමතුලිතයට එළඹි විට සමතුලිත සාන්ද්‍රණ ගණනය කරන්න.

vii) ඉහත vi) හි සඳහන් සමතුලිත අවස්ථාව සඳහා $K_p$ ගණනය කරන්න.

(සැ.යු $ax^2+bx+c=0$ හි විසඳුම $x=\frac{-b\pm\sqrt{b^2-4ac}}{2a}$ )

alsciencepapers .blogspot.com

c) A නමැති වායුවක් පහත පරිදි වියෝජනය වෙමින් සමතුලිතයට එළඹේ.

$A(g) \rightleftharpoons B(g) + 2C(g)$

A වායුව 1mol ක් $1dm^3$ බඳුනකට ඇතුලත් කර උෂ්ණත්වය $227^{0}C$ පත් කළවිට සෑදෙන C(g) ද වියෝජනය වෙමින් තවත් සමතුලිතයක් ඇති වේ.

$C(g) \rightleftharpoons 2D(g) + 3B(g)$

$227^{0}C$ උෂ්ණත්වයේදී ඉහත සමතුලිතයන් සඳහා Kc අගයන් පහත පරිදි නිරූපණය කෙරේ.

$A(g) \rightleftharpoons B(g) + 2C(g)\ ,\ K_{C1}$

$C(g) \rightleftharpoons 2D(g) + 3B(g)\ ,\ K_{C2}$

i) සමතුලිත පීඩනය ආරම්භක පීඩනයෙන් (A විඝටනයට පෙර) $\frac{13}{6}$ ක්ද C හි සමතුලිත සාන්ද්‍රණය A හි සමතුලිත සාන්ද්‍රණය මෙන් $\frac{4}{9}$ ක් ද වේ නම්, මෙම අවස්ථාවේ $K_{C1}$ හා $K_{C2}$ ගණනය කරන්න.

ii) $227^{0}C$ ඉහත $C(g) \rightleftharpoons 2D(g) + 3B(g)$ ප්‍රතික්‍රියාව සඳහා Kp ගණනය කරන්න.

d) $N_2O_4$ මවුල 5 ක් හා $NO_2$ වායුව මවුල 5 ක් $25^{0}C$ උෂ්ණත්වයේදී දෘඪ බඳුනකට ඇතුල්කර එම උෂ්ණත්වයේම පවත්වා ගත් විට පහත පරිදි ප්‍රතික්‍රියාව සිදු වේ. ([illegible])

$N_2O_4(g) \rightleftharpoons 2NO_2(g)$

මෙවිට බඳුන තුළ මුළු පීඩනය $2 \times 10^5$ Pa විය. සම්මත ගිබ්ස් ශක්ති අගයන් පහත පරිදි වේ.

| | $\Delta G^{0}_{f}\ kJmol^{-1}$ |
|---|---|
| $N_2O_4(g)$ | 100 |
| $NO_2(g)$ | 50 |

i) $25^{0}C$ දී හි ආංශික පීඩන ගණනය කරන්න.

ii) ඉහත ප්‍රතික්‍රියාව සඳහා $25^{0}C$ ප්‍රතික්‍රියා ලබ්ධිය (Q) ගණනය කරන්න.

iii) $25^{0}C$ දී ඉදිරි ප්‍රතික්‍රියාව සඳහා $\Delta G$ ගණනය කරන්න.

(සමතුලිත ප්‍රතික්‍රියාවක් සඳහා $\Delta G = \Delta G^{0} + 2.303RT\log Q$)



Scanned by CamScanner

iv)




ඔබ ලබාගත් ඉහත $\Delta G$ අගය , ඉහත ප්‍රස්ථාරයේ අනුක්‍රමණය මගින් ලැබෙන අගයට අනුරූප වේ නම් ප්‍රස්ථාරයේ දක්වා ඇති A, B, C ලක්ෂ්‍ය වලින් එම අගයට සමාන වනුයේ කවර ලක්ෂ්‍යය දැයි දක්වන්න.

alsciencepapers .blogspot.com

6) a) i) රවුල් නියමය වචනයෙන් ප්‍රකාශ කරන්න.

ii) ව්‍යාප්ති සංගුණකය යොදනු ලබන පද්ධතියක තිබිය යුතු ලක්ෂණ සඳහන් කරන්න.

A හා B යනු එකිනෙකින් අමිශ්‍ර ද්‍රව දෙකකි. B ද්‍රවය වාෂ්පශීලී වන අතර එහි ඝනත්වය 0.8 $gcm^{-3}$ වේ. A ද්‍රවය අවාෂ්පශීලී වන අතර එහි ඝනත්වය 1.2 $gcm^{-3}$ කි. A ද්‍රවයෙන් 60$cm^3$ ක් හා B ද්‍රවයෙන් 40$cm^3$ ක් බඳුනට එකතු කර බඳුන වසන ලදී. $27^0C$ බඳුන තුළ වාෂ්ප පීඩනය $8 \times 10^4 Pa$ විය. මෙම පද්ධතියට "S" නමැති අවාෂ්පශීලී සංයෝගයෙන් මවුල 1.5 ක් එකතු කර හොඳින් සොලවා $27^0C$ දීම පද්ධතිය සමතුලිත වීමට ඉඩ හරින ලදී. S සංයෝගය A හා B ද්‍රව දෙක තුළම ද්‍රාව්‍ය වේ. $27^0C$ දී සමතුලිත පද්ධතියේ වාෂ්ප පීඩනය $5 \times 10^4 Pa$ විය.

iii) A හා B හි සාපේක්ෂ අණුක ස්කන්ධ පිළිවෙලින් 24 හා 16 වේ නම්, මිශ්‍ර කළ A හා B හි මවුල ප්‍රමාණ වෙන වෙනම ගණනය කරන්න.

iv) B ද්‍රවය තුළ "S" හි මවුල භාගයත්, මවුල ප්‍රමාණයත් ගණනය කරන්න.

v) A ද්‍රවය තුළ S හි සාන්ද්‍රණය කොපමණ වේද?

vi) $27^0C$ දී A හා B අතර S හි ව්‍යාප්ති සංගුණකය ගණනය කරන්න.

vii) ඉහත ගණනය කිරීම සඳහා යොදාගත් වැදගත් උපකල්පන දෙකක් සඳහන් කරන්න.

viii) සමතුලිත පද්ධතියෙන් A ද්‍රවය සම්පූර්ණයෙන් ඉවත් කර නව සංශුද්ධ A ද්‍රවය 48 $cm^3$ ක් එකතු කර හොඳින් සොලවා $27^0C$ දී පද්ධතිය සමතුලිත වීමට ඉඩහරින ලදී. වාෂ්ප කලාපයේ නව පීඩනය කොපමණද?

b) i) HF හි $K_a$ අගය, $F^-$ හි $K_b$ හා ජලයේ $K_w$ අතර සම්බන්ධතාවය ලියා දක්වන්න.

ii) සාන්ද්‍රණය 0.1$moldm^{-3}$ වූ NaF ජලීය ද්‍රාවණයක $25^0C$ දී pH අගය ගණනය කරන්න. ($K_W = 1 \times 10^{-14} mol^2dm^{-6}$, HF හි $K_a = 6.4 \times 10^{-4} moldm^{-3}$)

iii) ඉහත ii) කොටසේ ජලීය ද්‍රාවණය තුළ $CaCl_2$ ඝනය දිය කිරීමේදී, එහි pH අගය කෙසේ වෙනස් වේ දැයි පැහැදිලි කරන්න.

- $25^0C$ දී $CaF_2$ ඝනය 7.8 mg ක් ජලය 0.5$dm^3$ ක් අඩංගු භාජනයකට එකතු කර හොඳින් කලතන ලදී. අදාල උෂ්ණත්වයේදී $CaF_2$ හි $K_{sp}$ අගය $4 \times 10^{-12} mol^3dm^{-9}$ වේ. (Ca - 40, F - 19)

iv) $CaF_2$ ඝනයෙන් කොටසක් දිය නොවී ඉතිරි වන බව ගණනය කිරීමෙන් පෙන්වන්න.

v) ඉතිරි වන $CaF_2$ ඝනය මවුල ප්‍රමාණය කොපමණද?

vi) ඉහත පද්ධතියට ඉතා සාන්ද්‍ර HCl ද්‍රාවණයෙන් බිංදුව බැගින් එකතු කිරීමේදී දිය නොවී ඉතිරිව තිබූ $CaF_2$ ක්‍රමක්‍රමයෙන් දිය වේ. මෙය සිදු වූ ආකාරය පැහැදිලි කරන්න.

vii) එම උෂ්ණත්වයේදී $CaF_2$ සියල්ල දියවන අවස්ථාවේදී මාධ්‍යයේ pH අගය ගණනය කරන්න.



Scanned by CamScanner

7) a) පහත ඒවාට හේතු පැහැදිලි කරන්න.

i) $R-OH$ වලට වඩා $R-NH_2$ වල භාෂ්මිකතාව ඉහළ වේ.

ii) $R-\overset{O}{\overset{\|}{C}}-H$ වලට වඩා $R-\overset{O}{\overset{\|}{C}}-Cl$ වලට නියුක්ලියෝෆිලික ප්‍රතිකාරක මගින් පහරදීම පහසු වේ.

b) පහත සඳහන් පරිවර්තනය පියවර හයකට (6) නොවැඩි පියවර සංඛ්‍යාවකින් ඔබ සිදුකරන්නේ කෙසේ දැයි පෙන්වන්න.




c) i) තනුක NaOH ඇතිවිට $H-\overset{O}{\overset{\|}{C}}-H$ සහ $CH_3CHO$ අතර ප්‍රතික්‍රියාවෙන් සෑදිය හැකි සියලුම ඵල දක්වන්න.

ii) එකම ආරම්භක කාබනික සංයෝගය ලෙස $CH_3CH_2CH_2OH$ පමණක් උපයෝගී කර ගනිමින් පියවර හයකට (6) නොවැඩි පියවර සංඛ්‍යාවකින්




සංශ්ලේෂණය කරන ආකාරය දක්වන්න.

alsciencepapers .blogspot.com

d) පහත ද්‍රව්‍ය ලැයිස්තුවේ ද්‍රව්‍ය පමණක් උපයෝගී කරගනිමින් පහත සංයෝග සංශ්ලේෂණය කරන්න.

($Na$, $Mg$, $C_2H_5OH$, $H_2SO_4$, $KMnO_4$, $PCl_5$, $NH_3$, $C_2H_5OC_2H_5$)

i) $CH_3-\overset{O}{\overset{\|}{C}}-\overset{H}{\overset{|}{N}}-CH_2CH_3$

ii) $CH_3-\underset{CH_2CH_3}{\underset{|}{\overset{OH}{\overset{|}{C}}}}-CH_2CH_3$

e) **$CH_3CH_2Br$ හා $CH_3CH_2O^-Na^+$** අතර ප්‍රතික්‍රියාවෙන් සෑදිය හැකි සියලුම ඵල දක්වා, එම ඵල සෑදීම සඳහා යාන්ත්‍රණයක් බැගින් ලියන්න.



Scanned by CamScanner

## C කොටස - රචනා

ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න. (එක් ප්‍රශ්නයකට ලකුණු 15 බැගින් ලැබේ.)

8) a) i) ආවර්තිතා වගුවෙහි d ගොනුවට අයත් M නම් ලෝහය A නම් වර්ණවත් සංයෝගය සාදයි. A තාප වියෝජනයෙන් B නම් කොළ පැහැති ඝනයක්, C නම් දුඹුරු කළු පැහැති ඝනයක් හා D නම් අවර්ණ වායුව ලබා දේ. B හි ජලීය ද්‍රාවණයක pH අගය ස්වල්ප වශයෙන් අඩු කිරීමේදී A හි ද්‍රාවණයක් බවට පත්වේ. A හි ජලීය ද්‍රාවණයක් සාන්ද්‍ර KOH මගින් භාෂ්මික කිරීමේදී B හි කොළ පැහැති ද්‍රාවණය හා D වායුව ලබා දේ.

I) A, B, C හා D යන රසායනික ප්‍රභේද හඳුනාගන්න.

II) A හි තාප වියෝජනය සඳහා තුලිත රසායනික සමීකරණය ලියන්න.

III) A හි ජලීය ද්‍රාවණයක් අනුමාපන සඳහා භාවිතයේදී ඇති වාසියක් හා අවාසියක් සඳහන් කරන්න.

ii) d ගොනුවට අයත් N නම් මූලද්‍රව්‍යය E නම් සංයෝගයක් සාදයි. ඉහත i) කොටසෙහි විස්තර කල A හි ආම්ලික ද්‍රාවණයක් E සමඟ ක්‍රියාවේදී E ද්‍රාවණය කහ-දුඹුරු පැහැයට හැරේ. E ද්‍රාවණය තුළින් D වායුව යැවීමෙන්ද ද්‍රාවණය කහ- දුඹුරු වේ.

E හි ජලීය ද්‍රාවණයක් $BaCl_2$ සමඟ ක්‍රියාවෙන් ලබා දෙන සුදු අවක්ෂේපය තනුක $HNO_3$ තුල දිය නොවේ.

I) E හි ඇති කැටායනය හඳුනාගන්න.

II) E හි ඇති ඇනායනය හඳුනාගන්න.

III) E හා A අතර භාෂ්මික මාධ්‍යයේදී සිදුවන ප්‍රතික්‍රියාව සඳහා තුලිත රසායනික සමීකරණය ලියන්න.

alsciencepapers .blogspot.com

b) ඛනිජ වැලි නිධියකින් ලබාගත් සාම්පලයක ඉල්මනයිට් ($FeO$, $TiO_2$) සහ වෙනත් නිෂ්ක්‍රීය ජල අද්‍රාව්‍ය සංයෝග අඩංගු වේ. මෙහි වූ $TiO_2$ ප්‍රතිශතය සෙවීම සඳහා කරන ලද පරීක්ෂණයක් පහත වේ.

පියවර 1

ඛනිජ වැලි සාම්පලයකින් 50g ක් ගෙන එය 96% සාන්ද්‍ර සල්ෆියුරික් අම්ලය සමඟ $180^0C$ පමණ උණුසුම් කරන ලද අතර ප්‍රතික්‍රියා සිදුවීම සඳහා සෑහෙන තරම් කාලයක් ලබා දුනි. අනතුරුව ද්‍රාවණය පෙරණ ලද අතර ලද අවශේෂයේ වියළි ස්කන්ධය 4.4g විය. පෙරණය $250.00cm^3$ ක පරිමාමිතික ජලාස්කුවකට මාරු කරන ලද අතර සලකුණ තෙක් ආසුත ජලය එකතු කරන ලදී.

පියවර 2

ඉහත ද්‍රාවණයෙන් $25.00\ cm^3$ ගෙන $0.4moldm^{-3}$ $K_2Cr_2O_7$ ද්‍රාවණය $20.0cm^3$ එකතු කරන ලදී. ඉතිරිව ඇති $K_2Cr_2O_7$ ප්‍රමාණය සොයා ගැනීම සඳහා මිශ්‍රණයට $H_3PO_4$ එකතු කර $0.6moldm^{-3}$ $FeSO_4$ ද්‍රාවණයක් සමඟ අනුමාපනය කරන ලදී.ආන්ත ලක්ෂ්‍යය $30.00cm^3$ විය. (Ti = 48 ,Fe = 56 ,O = 16)

i) මෙම ක්‍රියා පිළිවෙලෙහි සිදුවන සියළුම ප්‍රතික්‍රියා සඳහා තුලිත රසායනික සමීකරණ ලියන්න.

ii) ඛනිජ වැලි සාම්පලයේ $TiO_2$ ස්කන්ධ ප්‍රතිශතය ගණනය කරන්න.

iii) යකඩ නිස්සාරණය සඳහා මෙමගින් ලැබෙන FeO යොදාගන්නේ නම් යකඩ ටොන් 1 ක් (1000kg) ක් ලබා ගැනීමට අවශ්‍ය ඛනිජ වැලි ස්කන්ධය සොයන්න.



Scanned by CamScanner

9) a) මෙම ප්‍රශ්නය ඔස්වල්ඩ් ක්‍රමයෙන් නයිට්‍රික් අම්ලය නිෂ්පාදනය හා සම්බන්ධ වේ. එහි මුල් පියවර වනුයේ ඇමෝනියා උත්ප්‍රේරක හමුවේදී නයිට්‍රජන්මොනොක්සයිඩ් බවට ඔක්සිකරණය කරවීමයි.

$$4NH_3(g) + 5O_2(g) \longrightarrow 4NO(g) + 6H_2O(g) \quad \Delta H^{\theta} = -909\ kJmol^{-1}$$

i) ඉහත පියවරෙහි භාවිතාවන සියලු තත්ව සඳහන් කර එම තත්ව භාවිතයට හේතුවන භෞත-රසායනික මූලධර්ම පහදන්න.

ii) මෙහිදී උත්ප්‍රේරක ලෙස යොදාගනුයේ ලෝහ දැලකි. එය දැල් ආකාරයෙන් භාවිතා කිරීමේ ප්‍රයෝජනය කුමක්ද?

iii) නයිට්‍රික් අම්ලයෙන් ආරම්භ කරමින්,

I) NO II) $N_2O_3$

ලබාගන්නේ කෙසේ දැයි තුලිත රසායනික සමීකරණ මගින් දක්වන්න.

b) i) යකඩ නිස්සාරනයේදී භාවිතා වන ලෝපස් වර්ග තුනක් නම් කර, ඒවායේ රසායනික සූත්‍ර ලියා දක්වන්න.

ii) යකඩ නිස්සාරනයේදී භාවිතා වන ලෝපස් හැර අනෙකුත් අමුද්‍රව්‍ය සඳහන් කර ඒවායේ කාර්යය කෙටියෙන් සඳහන් කරන්න.

iii) ධාරා උෂ්මකය තුල ලෝපස් යකඩ බවට පත් වීමේදී සිදුවන සියලුම ප්‍රතික්‍රියා සඳහා තුලිත සමීකරණ ලියන්න.

iv) ධාරාඋෂ්මකය පතුලේ සෑදෙන අමුයකඩ එහි පවතින අධික උෂ්ණත්වය හමුවේ ආරක්ෂාව පවතින ආකාරය දක්වන්න.

v) ධාරාඋෂ්මකය තුල $1000^{0}C$ ට වඩා වැඩි උෂ්ණත්වයේදී ස්ථායීව පවතින වායුව සඳහන් කරන්න.

vi) එම වායුව එම උෂ්ණත්වයේදී ස්ථායීව පැවතීමට හේතුව ගිබ්ස් ශක්තිය ඇසුරින් පැහැදිලි කරන්න.

c) පසුගියදා හොරණ ප්‍රදේශයේ රබර් කර්මාන්ත සාලාවක සිදු වූ හදිසි අනතුරකින් කිහිප දෙනෙකු මරණයට පත් විය.

alsciencepapers .blogspot.com

i) එම සිදුවීමට හේතු වූ, රබර් කර්මාන්ත සාලාවකින් පරිසරයට එකතු විය හැකි වායුව කුමක්ද?

ii) එම වායුව අඩංගු වන රසායනික ද්‍රව්‍යයෙන් රබර් කර්මාන්තයේ දී ලබා ගන්නා ප්‍රයෝජනය කුමක්ද?

iii) අම්ල වැසි ඇති වීමට හේතු විය හැකි නයිට්‍රජන් අඩංගු වායු දෙකක් සඳහන් කරන්න.

iv) වායු ගෝලයේ $CO_2$ මට්ටම ඉහළ යාම ගෝලීය උෂ්ණත්වයට සැලකිය යුතු බලපෑමක් සිදු කරනු ලබන නමුත් අම්ල වැසි ඇතිවීමට බලපෑමක් සිදු නොකරයි. මෙම ප්‍රකාශනය කෙටියෙන් පහදන්න.

v) නයිට්‍රජන් හි ඔක්සයිඩයක් මගින් ආරම්භකරමින් ප්‍රකාශ රසායනික ධූමිකාව ඇතිවන අයුරු පහදන්න.

vi) ප්‍රකාශ රසායනික ධූමිකාව මගින් මිනිසාට, ද්‍රව්‍යවලට, වායුගෝලයට හා ශාක වලට ඇතිවන අහිතකර බලපෑම් වෙන වෙනම ලියා දක්වන්න.

vii) ඕසෝන් ස්ථරයෙහි ඕසෝන් සෑදීමත්, විනාශ වීමත් ස්වාභාවිකව සිදුවන අයුරු තුලිත රසායනික සමීකරණ මගින් දක්වන්න.

viii) ඕසෝන් ස්ථරය විනාශ වීමට හේතු වන වායු තුනක් නම්කර, එම එකී වායුවක් ඕසෝන් හායනයට සිදුකරන අයුරු තුලිත රසායනික සමීකරණ මගින් දක්වන්න.

ix) ඕසෝන් ස්ථරය ක්ෂය වීමේ ආදීනව, එය ආශ්‍රිත ගැටළු තුනක් ඇසුරින් ලියා දක්වන්න.

x) පරිසර ගැටළු ඇතිකරන දූෂක වායු, පරිසරයට විමෝචනය වීම අවම කරවා ගැනීම සඳහා භාවිතා කළ හැකි ක්‍රියාකාරකම් තුනක් සඳහන් කරන්න.



Scanned by CamScanner

10) a) $NaHSO_4$, $H_2SO_3$, හා $Mn(NO_3)_2$ ද්‍රාවණ හා සුදුසු ඉලෙක්ට්‍රෝඩ භාවිතා කර විද්‍යුත් රසායනික කෝෂයක් නිර්මාණය කර ඇත. අදාල අර්ධ ප්‍රතික්‍රියා

$$HSO_4^-(aq) + 3H^+(aq) + 2e \rightleftharpoons H_2SO_3(aq) + H_2O(l) \; ; E^\theta = +0.17V$$
$$Mn^{2+}(aq) + 2e \rightleftharpoons Mn(s) \; ; E^\theta = -1.18V$$

I. i) සම්මත අවස්ථාවේ පවතින ඉහත විද්‍යුත් රසායනික කෝෂයේ දළ සටහනක් ඇඳ කොටස් නම් කරන්න. (ලවණ සේතුවක් ඇතුලත් විය යුතු වේ)

ii) $HSO_4^-(aq) | H_2SO_3(aq)$ අර්ධ කෝෂයේ ඉලෙක්ට්‍රෝඩය ලෙස භාවිතා කල හැකි ද්‍රව්‍යක් ලියන්න.

iii) බාහිර පරිපථයේ ඉලෙක්ට්‍රෝන ගමන් කරන දිශාව පෙන්වන්න.

iv) ලවණ සේතුවේ කැටායන ගමන් කරන දිශාව දක්වන්න.

II) සමස්ථ කෝෂ ප්‍රතික්‍රියාව නිරූපණය කිරීමට තුලිත රසායනික සමීකරණය ලියන්න.

III) $25^0C$ දී කෝෂයේ විද්‍යුත්ගාමක බලය ගණනය කරන්න.

IV) සම්මත අංකනය භාවිතයෙන් සම්මත අවස්ථාවේ පවතින ඉහත විද්‍යුත් රසායනික කෝෂය නිරූපණය කරන්න.

V) ඉහත කෝෂයේ අර්ධ කෝෂ දෙකටම ජලීය $Ba(NO_3)_2$ ද්‍රාවණයක් එක්කල විට දී කෝෂයේ විද්‍යුත් ගාමක බලයට සිදුවන වෙනස ගුණාත්මකව පැහැදිලි කරන්න. ($BaSO_3$, $Ksp = 8.3 \times 10^{-7} mol^2dm^{-6}$, $BaSO_4$, $Ksp = 1.2 \times 10^{-10} mol^2dm^{-6}$)

alsciencepapers .blogspot.com

VI) ඉහත කෝෂයේ ඇනෝඩයේ වර්ගඵලය දෙගුණ කළ විට කෝෂයේ විද්‍යුත් ගාමක බලයේ සිදුවන වෙනස ගුණාත්මකව පහදන්න.

C) විලීන ammonium thiocyanate වලට ammonium dichromate(VI) ක්‍රමයෙන් එකතු කළ විට පහත ලවණය ලැබේ.

$$NH_4[Cr(NH_3)_x(SCN)_y]$$

මෙම ලවණයේ මූලද්‍රව්‍ය සංයුතිය ස්කන්ධය අනුව පහත දක්වේ.

Cr = 15.5%    N = 29.2%    S = 38.15%  (Cr =52 , S= 32.1 , N = 14 , C=12 , H =1)

i) x හා y අගයන් ගණනය කරන්න.

ii) Cr හි ඔක්සිකරණ අංකය සොයන්න.

iii) මෙහි සංකීර්ණ අයනයේ ජ්‍යාමිතිය කුමක්ද?

iv) මෙහි ඇනායනය සඳහා තිබිය හැකි ව්‍යුහ 02 ක් අඳින්න.

d) කොපර් හා අයඩින් අතර සිදුවන ප්‍රතික්‍රියා කිහිපයකට අදාල දත්ත පහත දක්වේ. (සියලු ප්‍රතික්‍රියා 298K ට අදාල වේ.)

$$CuI(s) \rightleftharpoons Cu^+(aq) + I^-(aq) \; ; Ksp = 1.2 \times 10^{-12} mol^2dm^{-6}$$
$$Cu^+(aq) + 2I^-(aq) \rightleftharpoons CuI_2^-(s) \; ; K = 7 \times 10^8 mol^2dm^{-6}$$
$$Cu^{2+}(aq) + 2e \rightleftharpoons Cu(s) \; ; E^0 = +0.337V$$
$$Cu^{2+}(aq) + e \rightleftharpoons Cu^+(s) \; ; E^0 = +0.159V$$
$$I_2(s) + 2e \rightleftharpoons 2I^-(aq) \; ; E^0 = +0.540V$$

I) CuI(s) මවුල $1 \times 10^{-3}$ ක් ජලය $1dm^3$ තුල අවලම්බනය කල විට දියවන CuI මවුල ගණන කොපමණද?

II) ඉහත I හි මිශ්‍රණය තුළ ඇති CuI සම්පූර්ණයෙන් දිය කිරීමට එයට එක් කල යුතු NaI මවුල ගණන කොපමණද?

III) උදාසීන ද්‍රාවණයක $Cu^+$ ද්විධාකරණයට අදාල ප්‍රතික්‍රියාවේ සමතුලිතතා නියමය ගණනය කරන්න.



Scanned by CamScanner

$2Cu^{+}(aq) \rightleftharpoons Cu^{2+}(aq) + Cu(s)$ ;

$\Delta G^{\theta} = -nFE^{\theta}$ $\quad\quad$ $\Delta G^{\theta} = -RT\ lnK(aq)$

$\Delta G^{\theta} = -2.303\ RT\ log_{10} K$

($n$ = ගලායන ඉලෙක්ට්‍රෝන ගණන )

IV ) $CuI_2$ ස්ථායී නොවේ. ජලීය මාධ්‍යයේ $CuI_2$ වියෝජනයට අදාල ප්‍රතික්‍රියාවක් ලියා එය සම්මත තත්ව වලදී ස්වයංසිද්ධ බව සලකන්න.

alsciencepapers .blogspot.com



Scanned by CamScanner

# Royal College, Colombo - 07
## G.C.E. (A/L) 2018..
## MCQ Answer Sheet

Grade - 13

**Subject and Subject No:** Chemistry I

**Index Number :**

alsciencepapers.blogspot.com

(01) (02) (03) (04) (05) (06) (07) (08) (09) (10)

(11) (12) (13) (14) (15) (16) (17) (18) (19) (20)

(21) (22) (23) (24) (25) (26) (27) (28) (29) (30)

(31) (32) (33) (34) (35) (36) (37) (38) (39) (40)

(41) (42) (43) (44) (45) (46) (47) (48) (49) (50)

Code No. and Signature of the Examiner

No. of Correct answers :

Scanned by CamScanner

## Part A – Structured Essay

- **Answer all the questions**

01) a) Consider The following elements,

Cl, Ba, S, Mn, N, P, Cr, Al

Fill in the blanks with appropriate answer / answers with the assistance of the above given elements.

i) Element/s which is / or responsible for making a compound relevant to idiomatic titration with $Na_2SO3$ will be ............S...........

ii) Element/s which is / are having same oxidation numbers and with different colours and forming two oxyanions will be..........Cr...........

iii) Which element forms a substance which shows bleaching properies by reaction of its chloride with water? ............N..............

iv) Element/s which is / are liberating an inflammable gas with the reaction of NaOH (aq) will be ..............P..............

v) What are the elements with highest oxidation state and which are forming acidic, basic and amphoteric oxides respectively ..................Mn..........

alsciencepapers .blogspot.com

04 x5 =20

b) $N_3^-$ reacts with $CH_3 - \overset{\overset{O}{\parallel}}{C} - Cl$ forming $CH_3CON_3$. It has the following skeleton.

$$CH_3 - \overset{\overset{O}{|}}{C} - N - N - N$$

i) Assuming that $C\hat{N}N$ bond angle is approximately $118^0$ and N - N bond lengths are not equal to each other, draw the most acceptable Lewis structure for this molecules.



01 mark

ii) Draw four resonance structures for this molecule (excluding the structure drawn in part (i) above)



5x4 =20



Scanned by CamScanner

c) $(H_3O_3N_2P)^-$ is an anion which shows acidic properties One possible lewis structure for this anion is given below.



The atoms of above structure are numbered as follows.

Based on the lewis structure given above,



i) Complete the following table.

| | O (1) | N (2) | N (3) | P (4) |
|---|---|---|---|---|
| i) VSEPR pairs | 3 | 3 | 4 | 4 |
| ii) Electron pair geometry | Planer Triang | Planer Triangle | Tetrahed | Tetrahed |
| iii) Shape | angular | angular | angular | Tetrahedral |
| iv) Hybridization | $sp^2$ | $sp^2$ | $sp^3$ | $sp^3$ |

1 x 16 = 16 marks

ii) Give the approximate values of the following of bond angles.

alsciencepapers .blogspot.com

I) $H\hat{O}N$ ....115° – 118°....

II) $O\hat{N}N$ ....115 – 118°....

III) $N\hat{N}P$ ....103° – 107°....

IV) $N\hat{P}O$ ....105° – 109°....

01 x 4 = 4 marks

iii) Among $N_2$ and $N_3$ , Which one shows the highest electronegativity .Give reasons for your answer

$N_{(2)} > N_3$ — 04 marks

reason — 04 marks

d) State whether the following statements are true or false (Reasons are not required)

i) $LiN_3$ and $NaN_3$ are both stable molecules.........False.

ii) The solubility of group II hydroxides increases down the group primary due to decrease in hydration enthalphy of Cation...................False...

iii) By adding $CaCl_2$, melting point of NaCl can be reduced. ....True.........

iv) As the polarization power of $Be^{2+}$ is greater than that of $Ca^{2+}$, thermal decomposition of $BeCO_3$ gets more easier than that of $CaCO_3$..........True..........

01 x 4 = 4 marks



Scanned by CamScanner

a) Consider the following table regarding butane, diethyl ether, n - butanol and sodium n - butoxide

| Name | butane | diethyl ether | n - butanol | sodium n - butoxide |
|---|---|---|---|---|
| Molecular formula | $C_4H_{10}$ | $C_4H_{10}O$ | $C_4H_9OH$ | $C_4H_9O^-Na^+$ |
| Interactions between molecules | dispersion force | dispersion force dipole - dipole | dispersion force H - bonds | dispersion force ionic |

i) Select the nature of the interactions between molecules and state them in the relevant blanks in the above table.

Interactions: covalent, ionic, Hydrogen bonds, dipole - dipole interaction, dispersion forces

ii) Arrange the above four compounds according to increasing order of boiling points.

Sodium butoxide < n-butanol diethyl ether < butane

6 marks

02) a) A and B are two consecutive elements found in the S - block of the periodic table. A reacts with water at room temperature giving gas C and solution D. Salts of A give coloration to Bunsen flame in the flame test. A reacts with excess of oxygen forming two compounds E and F. E dissolves in water giving D as the only product while F dissolves in water giving D and G. G decomposes rapidly when exposed to light.

